# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1705/22 - 2011 මැයි 10 වැනි අඟහරුවාදා - 2011.05.10

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡේදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 8/2007.

**2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය පනත**

2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 67 වැනි වගන්තිය සමග කියවිය යුතු ය. එකී පනතේ 16 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තිය 17 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය සහ 18 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) ඡේදය යටතේ විදුලිබල හා බලශක්ති අමාත්‍යවරයා විසින් සාදන ලද නියෝග.

පාඨලී චම්පික රණවක,
විදුලිබල හා බලශක්ති අමාත්‍ය.

2011 මැයි මස 06 වැනි දින,
කොළඹ දී ය.

නියෝග

අංක 1599/6 සහ 2009 අප්‍රේල් මස 27 වැනි දින දරන අති විශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 2009 මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘති නියෝග, එහි "අ","ආ", "ඇ" සහ "ඈ" යන උපලේඛන ඉවත් කොට ඒ වෙනුවට පහත දැක්වෙන උපලේඛන ආදේශ කිරීමෙන් මෙයින් සංශෝධනය කරනු ලැබේ.

"අ" උපලේඛනය

| අයදුම්පතෙහි දිනය | | | | | | | | | | ලියාපදිංචි අංකය | R | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|

කාර්යාලීය ප්‍රයෝජනය සඳහා පමණි වර්ෂය මාසය දිනය

**මධ්‍යම ජාලය තුළ වූ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නිරතවෙමින් එවැන්නක් කරගෙන යාම සඳහා වන ඉල්ලීම**

පහත සඳහන් කර ඇති ව්‍යාපෘති වර්ග සඳහා

අනෙකුත් වර්ගයේ පුනර්ජනනීය බලශක්ති ව්‍යාපෘති පිළිබඳ ප්‍රතිපත්ති සඳහා "මධ්‍යම ජාලය තුල වූ නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ මාර්ගෝපදේශය" බලන්න.

1. ව්‍යාපෘති වර්ගය : අදාල කොටුවෙහි √ දමන්න. **එක් වර්ගයක්** තෝරාගන්න :

| කුඩා ජල | | සුළං | | ජෛවස්කන්ධ (වගා කරන ලද) | | අපද්‍රව්‍ය | | | | | | තාප ප්‍රකෘත්‍ය | | වෙනත් (කරුණාකර විස්තර කරන්න) | |
|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|---|
| | | | | | | කෘෂි | | කාර්මික | | නාගරික කසල | | | | | |

2. ව්‍යාපෘතියේ නම සහ එහි ධාරිතාව කි.වො. : ……………………………………………………………………
(ව්‍යාපෘතිය හඳුනා ගැනීමට පමණි. නෛතික නාමය පසුව ස්ථිර කළ හැක.)

3. ඉල්ලුම්කරුගේ නම සහ ලිපිනය : ……………………………………………………………………………..

(i) නම :…………………………………………………………………………………………(මයා/මිය……)
(ii) සමාගමේ නම (අදාළ වන්නේ නම් ) : ……………………………………………………………………
(iii) ලියාපදිංචි අංකය : …………………………………………………………………………………
(iv) සමාගමේ අධ්‍යක්ෂවරුන්ගේ නම් :…………………………………………………………………

ලිපිනය :………………………………………………………………………………………………

දුරකථන අංක :

| 0 | | | - | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|---|---|
| 0 | | | - | | | | | | | |

විද්‍යුත් ලිපිනය :……………………………………… @ ………………………………………………

අයදුම්කරු වෙත අයදුම්පත ඉදිරිපත් කිරීමට බලය පැවරූ අධ්‍යක්ෂ මණ්ඩල තීරණය (කරුණාකර අමුණන්න)

4. *ව්‍යාපෘතිය සඳහා පූර්ව ශක්‍යතා අධ්‍යයන වාර්තාව (කරුණාකර අමුණන්න)*

අධිකාරිය විසින් ප්‍රතීත උපදේශකයකු විසින් සකස් කරන ලද පනතේ 16 වැනි වගන්තියේ (2) වැනි උපවගන්තියේ (අ) සිට (ඊ) දක්වා සඳහන් විස්තර සහ ලේඛන අඩංගු පූර්ව ශක්‍යතා අධ්‍යයන වාර්තාවක්, ඉල්ලුම්කරු විසින් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතුය.

(අ) පහත දැක්වෙන කොටුවේ බලාගාරය ද ඇතුළුව ව්‍යාපෘතියට සම්බන්ධ සියළු කොටස් දැක්වෙන අයුරින් 1:50,000 පරිමාණයේ සිතියමක් අලවන්න.

ව්‍යාපෘතියේ දළ සැලැස්මේ 1:50,000 සිතියමේ පිටපත (1:50,000 පරිමාණය වෙනස් නොවිය යුතුය)
සිතියම් අංකය : .......................................... සිතියමේ නම : ..............................

(ආ) ජනනය කිරීමට බලාපොරොත්තු වන බලය සහ ව්‍යාපෘතිය පිළිබඳ කෙටි විස්තරයක්

| ව්‍යාපෘති විස්තරය | ව්‍යාපෘති වර්ගය |
|---|---|
| බලාගාරයේ ස්ථාපිත ධාරිතාව (kw) කි.වො. | |
| ජල මාර්ගයේ නම (කුඩා ජල නම්) | |
| ව්‍යාපෘතියේ නම | |
| වසරකට ජනනය කළ හැකි බලශක්ති ප්‍රමාණය (GWh) ගි.වො.පැ | |

| **යෝජිත ව්‍යාපෘතියේ භූගෝලීය පිහිටීම විස්තර සපයන්න** | |
|---|---|
| ගම/ග්‍රාම නිලධාරී වසම | |
| ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය | |
| දිස්ත්‍රික්කය | |

(ඇ) භාවිතා කරන ලද ප්‍රශස්ථකරණ උපමානය සහ ව්‍යාපෘතිය වෙනුවෙන් ඇස්තමේන්තු කල මුළු වියදම:

(ඈ) ප්‍රමාණවත් මූල්‍ය ප්‍රතිපාදන ඇති බවට සාධක හෝ ව්‍යාපෘතිය සඳහා අවශ්‍ය කරන මුදල් ලබාගන්නා ආකාරය:

(ඉ) ව්‍යාපෘතියේ පිහිටීම (එය ජල විදුලි ව්‍යාපෘතියක් වේ නම්, ගංගාවට හෝ දිය පහරට අදාළව ජාකොටුව සහ බලාගාරය, එය සුළං ව්‍යාපෘතියක් වේ නම්, සුළං තලබමන සහ ව්‍යුහයන්, එය ජෛව ස්කන්ධ ව්‍යාපෘතියක් වේ නම් ඉන්ධන වගාව, බලාගාරය සහ ජල මූලාශ්‍රය සහ එය වෙනත් යම් ව්‍යාපෘතියක් වේ නම්, බලශක්ති මූලාශ්‍රයට අදාළව පරිවර්තනය කිරීමේ නිමාවන් ; සහ

(ඊ) ජනනය කරන ලද විදුලිබලය සම්ප්‍රේෂණය කිරීමට ඉල්ලුම්කරු අපේක්ෂා කරන්නේ කෙසේද යන්නත්, ජාතික විදුලිබල ජාලයට ජනක යන්ත්‍රය සම්බන්ධ කරනු ලබන ස්ථානය සහ මේ කාර්යය සඳහා අදින විදුලි රැහැන් මාර්ගය සම්බන්ධ භූගෝලීය ප්‍රදේශය පිළිබඳව ද පැහැදිලි කරමින් වූ ප්‍රකාශයක්;

**ඉල්ලුම්කරුගේ සහතිකකරණය**

* මෙම ඉල්ලුම් පත්‍රයට අමුණා ඇති පූර්ව ශක්‍යතා අධ්‍යයන වාර්තාව ........... නම් වූ එකී වාර්තාවේ පළමු වන පිටුවේ සඳහන් නම හා අත්සන සඳහන් වන්නා වූ ද, අධිකාරිය විසින් ප්‍රතීත කරන ලද්දා වූ ද උපදේශක වරයකු විසින් සකස් කරනු ලැබූවක් බව මෙයින් සහතික කරමි.
* මෙම ඉල්ලුම් පත්‍රය සමග ඉල්ලුම් කිරීමට නියමිත ගාස්තුව වෙනුවෙන් නිකුත් කරන ලද කුවිතාන්සියේ පිටපතක් මෙයට අමුණා ඇත.
* අධ්‍යක්ෂ ජනරාල් විසින් ඉල්ලා ඇති පරිදි ප්‍රභවය පිළිබඳ තාක්ෂණික හා අනෙකුත් විස්තර මේ සමග අමුණා ඇත.
* "මධ්‍යම ජාලය තුල වූ නැවත බලගැන්විය හැකි බලශක්ති සංවර්ධනය සඳහා ව්‍යාපෘති අනුමත කිරීමේ ක්‍රියාවලිය පිළිබඳ මාර්ගෝපදේශයේ " දැනට වලංගු ප්‍රකාශනය මා විසින් කියවා තේරුම් ගතිමි.

ඉල්ලුම්පත්‍රය අත්සන් කරන්නාගේ නම: ........................................................................................................................

අත්සන .............................................

දිනය .........................
වර්ෂය මාසය දිනය

"ආ" උපලේඛනය

**මධ්‍යම ජාලයට සම්බන්ධිත නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නියැලෙමින් එය පවත්වාගෙන යාම වෙනුවෙන් අයදුම් කිරීමේ ගාස්තුව**

| තීරු 1 | තීරු 11 |
|---|---|
| අයදුම්පතක් ඉදිරිපත් කිරීමේ දී හෝ නැවත අයදුම් කිරීමේ දී ගෙවිය යුතු ගාස්තුව | යෝජිත ජනන ධාරිතාව |
| රුපියල් 100,000 | කිලෝ වොට් 1,000 හෝ එයින් කොටසකට |
| රුපියල් 50,000 | වැඩි වන සෑම කිලෝ වොට් 1,000 කටම, අනුපාතිකව |

<u>සටහන</u>: කිලෝවොට් 10,000 කට අඩු ව්‍යාපෘති කිහිපයක් එක් පාර්ශවයක් මගින් හෝ එක්ව ක්‍රියාත්මක වන්නා වූ පාර්ශව කිහිපයක් විසින් එක් වර හෝ අදියර කිහිපයකින් එකම භූගෝලීය හෝ අවකාශීය පසුබිමක් තුල ක්‍රියාත්මක වන්නේ නම් එම ව්‍යාපෘති සමූහය කිලෝවොට් 10,000 කට වැඩි ස්ථාපිත ධාරිතාවක් සහිත එක් ව්‍යාපෘතියක් සේ සලකනු ලැබේ.

(ඇ) උපලේඛනය

**17 වන වගන්තියේ (2) වන උප වගන්තියේ (අ) ඡේදය යටතේ තාවකාලික අනුමැතිය**

දිනය
වර්ෂය මාසය දිනය

| | | | | | | | | |
|---|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි අංකය | R | | | | | | | |
| තාවකාලික අනුමත අංකය | PA | | | | | | | |

නම : ..........................................................................................................................

තනතුර (අදාළ නම් ) : ..........................................................................................................

සමාගමේ නම (අදාළ නම් ) : ....................................................................................................

:



ලිපිනය : ……………………………………………………………………………………………………………..............................................

ව්‍යාපෘතියේ නම : ………………………………………………………………………………………..................................................................

තාවකාලික අනුමතය ලබාදුන් දිනය : ………………………………………………………………………………………………..................................

(මෙම අනුමැතිය ලබා දුන් දිනයේ සිට මාස 6 කට පමණක් වලංගු වේ. අයදුම්කරුගේ ඉල්ලීමකට අනුව මෙම අනුමැතිය 2007 අංක 35 දරන පනතේ 17 වැනි වගන්තියට අනුව තව මාස 6කට දීර්ඝ කල හැක)

ව්‍යාපෘති වර්ගය : ……………………………………………………………………………………..................................

ව්‍යාපෘතියේ ධාරිතාව ස්ථාපිත ධාරිතාව කිලෝවොට් : ……………………………………..........……………………

ඉහත සඳහන් මධ්‍යම ජාලයට සම්බන්ධ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියේ නියැලෙමින් එය පවත්වාගෙන යාම සඳහා ඔබ විසින් .................................................. දින ඉදිරිපත් කරන ලද අයදුම්පතට අදාලය ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරියේ (මෙහි මින් ඉදිරියට අධිකාරිය වශයෙන් හඳුන්වනු ලබන)ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බල ශක්ති අධිකාරිය පනතේ 17 වගන්තියේ (2) වන උප වගන්තියේ (ආ) ජේදය යටතේ ක්‍රියා කරමින් පෙර කී ව්‍යාපෘතියට තාවකාලික අනුමතය දී තිබේ. අධිකාරිය සමග ඉදිරියේදී කරනු ලබන සියලුම ලිපි ගනුදෙනුවලදී සහ ව්‍යාපෘතියට අදාල සියලුම වාර්තාවලදී සහ වෙනත් ලේඛනගත කිරීම් වලදී ඉහත සඳහන් තාවකාලික අනුමතයේ අංකය උපයෝගි කරගත යුතුය.

මේ සන්නිවේදනය ලැබී සයමසක් ඇතුළත පහත දක්වෙන ලේඛන සහ තොරතුරු ඉදිරිපත් කරන ලෙස ඔබට මෙයින් දනුම් දෙනු ලැබේ. අවශ්‍ය ලේඛන සහ තොරතුරු ඒ කාලසීමාව තුළ ඉදිරිපත් කිරීමට ඔබට නොහැකි වන්නේ නම් මේ කාලසීමාව දීර්ඝ කරන ලෙස ඉල්ලීමක් කිරීමට ඔබට හිමිකමක් ඇත. එහෙත් ඒ අතිරේක කාලසීමාව සය මසක උපරිමයකට යටත් වනු ඇත. පහත දැක්වෙන ලේඛන සහ තොරතුරු මෙම අනුමැතියේ වලංගු කාලයට ප්‍රථම ඉදිරිපත් කිරීමට අපොහොසත් වන්නේ නම් 2007 අංක 35 දරන පනතේ 17 වැනි වගන්තියේ 4 වැනි උප වගන්තිය අනුව මෙම අනුමැතිය එහි වලංගු කාලය අවසානයේ දී නිරායාසයෙන්ම අවලංගු වන්නේය.

*ඉදිරිපත් කළ යුතු තොරතුරු සහ ලේඛන* :

(අ) පහත සඳහන් තොරතුරු

1. ……………………………………………………………………………………

2. ..………………………………………………………………………………… ආදිය සහ

(ආ) පහත සඳහන් ලේඛන

1. …………………………………………………………………………………

2. ..…………………………………………………………………………………

ආදිය ඔබ විසින් සැපයිය යුතු වේ.

*සාමාන්‍ය* :

* මේ ව්‍යාපෘතියේ නියැලීම පිණිස යම් යම් ආයතනවලින් ලබාගත යුතු යම් අනුමතයක් හෝ පැහැයුමක් (Clearance) ලබා ගැනීම සඳහා අධිකාරිය ඔබට සහාය වනු ඇත.

* මේ තාවකාලික අනුමතයේ දක්වා ඇති තොරතුරු සහ ලේඛන ලබා ගැනීම සඳහා ඔබ විසින් යම් මුදලක් වැය කළේ නම් එය ඔබ විසින්ම දරාගත යුතුය. වැය වූ මුදල් සම්බන්ධයෙන් අධිකාරියට කිසිඳු වගකීමක් නැත.

* මෙම තාවකාලික අනුමැතිය ලබාන්නා වූ නෛතික පුද්ගලයා හෝ එම නෛතික පුද්ගලයාගේ පාලන අයිතිය වෙනස් වන්නේ නම් එය නිසි පරිදි අධිකාරියට දැනුම් දිය යුතුය. අයදුම් ගාස්තුවට සමාන පරිපාලන ගාස්තුවක් ගෙවීමෙන් අනතුරුව එවැනි වෙනස් වීමක් බලාත්මක වනු ඇත.

අධ්‍යක්ෂ ජනරාල්
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය

පිටපත් :

(i) අධ්‍යක්‍ෂ ජනරාල්, ශ්‍රී ලංකා මහජන උපයෝගීතා කොමිෂන් සභාව

(ii) සභාපති සහ සාමාජිකයින් ව්‍යාපෘති අනුමත කිරීමේ කමිටුව

(iii) නියෝජ්‍ය සාමාන්‍යාධිකාරි (බලශක්ති මිලදී ගැනීම්), ලං.වි.ම - ව්‍යාපෘතියේ පිහිටීම දැක්වෙන සිතියමක් ඔබේ දැනගැනීම සහ සුදුසු කටයුතු සඳහා මේ සමග අමුණා ඇත

(iv) අධ්‍යක්‍ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

(v) ප්‍රාදේශීය ලේකම් ................ කොට්ඨාශය

***"ඇ" - උපලේඛනය***

***මධ්‍යම ජාලයට සම්බන්ධ නැවත බලගැන්විය හැකි බලශක්ති ව්‍යාපෘතියක නියැලී එය පවත්වාගෙන යාම සඳහා බලපත්‍රය***

| | | | | | | | |
|---|---|---|---|---|---|---|---|
| ලියාපදිංචි අංකය | R | | | | | | |
| තාවකාලික අනුමත අංකය | PA | | | | | | |
| බලපත්‍ර අංකය | EP | | | | | | |

ඉල්ලුම්කරුගේ නම හා ලිපිනය : ..........................................................................
(අවශ්‍ය නම්, විශේෂ අරමුණු සමාගම) ..........................................................................
..........................................................................

බලපත්‍ර අංකය : | EP | | | | | | |

ව්‍යාපෘති වර්ගය :.......................................................................................

ව්‍යාපෘතියේ නම:.......................................................................................

විදුලිය ජනනය කිරීමේ පිරියතේ (Plant) ධාරිතාවය කිලෝ වොට් : ................................

බලපත්‍රය නිකුත් කළ දිනය : | | | | | | | | |

වර්ෂය මාසය දිනය

(මෙහි මින්මතු "පනත" වශයෙන් හැඳින්වෙන ) 2007 අංක 35 දරන ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරි පනතේ 18 වැනි වගන්තිය යටතේ, (මෙහි මින්මතු "සංවර්ධනකරු" වශයෙන් හැඳින්වෙන)........................................... ට (ඉල්ලුම්කරුගේ නම ) (මෙහි මින්මතු " බලපත්‍රය" වශයෙන් හැඳින්වෙන ) නැවත බල ගැන්විය හැකි බලශක්ති බලපත්‍රයක් නිකුත් කොට ඇත. අධිකාරිය සමග ඉදිරියේදී කරනු ලබන සියලුම ලිපි ගනුදෙනු වලදී සහ ව්‍යාපෘතියට අදාල සියලුම වාර්තාවලදී සහ වෙනත් ලේඛනගත කිරීම් වලදී ඉහත දක්වා ඇති බලපත්‍ර අංකය උපයෝගි කරගත යුතුය.

මෙම බලපත්‍රය පහත සඳහන් නියමයන් ට සහ කොන්දේසිවලට යටත් ය :—

1. බලපත්‍රය නිකුත් කිරීමෙන් දෙවසරක් තුළ ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ යුතුය. එසේ නියමිත කාල සීමාවේ දී වාණිජ මෙහෙයුම් ආරම්භ කිරීමට අපොහොසත් වන අවස්ථාවක දී මෙම බලපත්‍රය අවලංගු කිරීමේ බලය අධ්‍යක්‍ෂ ජනරාල් සතුය.

2. බලපත්‍රය නිකුත් කොට විසි වසරක් සඳහා මේ බලපත්‍රය වලංගු වනු ඇත.

3. ප්‍රධාන අදියර දක්වෙන ව්‍යාපෘතිය ක්‍රියාත්මක කිරීමේ සැලැස්මක් බලපත්‍රය නිකුත් කිරීමෙන් දෙසතියක් තුළ අධිකාරියට ඉදිරිපත් කළ යුතුය.

4. ව්‍යාපෘතියේ අදියර සාක්ෂාත් කළ අන්දම දක්වෙන ප්‍රගති වාර්තාවක් බලපත්‍රය නිකුත් කිරීමේ දින සිට සෑම කාර්තුවක් අවසානයේදීම අධිකාරියට ඉදිරිපත් කළ යුතුය.

5. පිරියත (Plant) මගින් ජනනය කෙරෙන විදුලිය විකිණීම සඳහා කුඩා පරිමාණයේ බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමකට හෝ එවැනි වෙනත් ගිවිසුමකට ලංකා විදුලිබල මණ්ඩලය සමග මේ බලපත්‍රය නිකුත් කිරීමෙන් මසක් ඇතුළත සංවර්ධනකරු එළඹිය යුතුය. එවැනි සෑම ගිවිසුමකම පිටපතක් අධිකාරියට වහාම ඉදිරිපත් කළයුතුය.

6. ලංකා විදුලි බල මණ්ඩලය සමග එළඹුන බලශක්ති මිලදී ගැනීමේ ගිවිසුමේ දක්වෙන පරිදි ව්‍යාපෘතියේ වාණිජ මෙහෙයුම් ආරම්භ කළ දිනය සහතික කෙරෙන ලංකා විදුලි බල මණ්ඩලය විසින් නිකුත් කළ සහතිකයක්, එම දිනයේ සිට මසක් ඇතුලත අධිකාරියට ඉදිරිපත් කල යුතුය.

7. ව්‍යාපෘතියේ වාණිජමය මෙහෙයුම් ආරම්භ වී තෙමසක් ගතවූ වහාම වරලත් ගණකාධිකාරිවරයෙකු විසින් සහතික කරන ලද ගිණුම් වාර්තාවක් සංවර්ධනකරු විසින් ඉදිරිපත් කළයුතුය. ව්‍යාපෘතියට තාවකාලික අවසරය ලැබුණ දින සිට වාණිජ මෙහෙයුම් ආරම්භ වී තෙමසක් ගතවූ දින තෙක් සංවර්ධනකරු විසින් කරන ලද සියලුම ගනුදෙනු මේ වාර්තාවෙන් ආවරණය විය යුතුය.

8. බලශක්තිය මිලට ගැනීමට අදල ගිවිසුමේ හෝ වෙනත් එවැනි ගිවිසුමක විස්තර කර ඇති නාමමාත්‍ර වාර්ෂික බලශක්ති සැපයුමෙන් හෝ තැරුයු (guaranteed) අවම බලශක්ති ප්‍රමාණයෙන් 50%කට නොඅඩු ප්‍රමාණයක් පස් වසරක අඛණ්ඩ කාලයක් තුල පිරියත (Plant) මගින් සැපයිය යුතුය.

9. මධ්‍යම ජාලයට සම්බන්ධ කිරීම්වලට අදල ලංකා විදුලිබල මණ්ඩලයේ ප්‍රමිතිවලට අනුකූලවන පරිදි පිරියත (Plant) සැලසුම් කිරීම, ඉදිකිරීම, ආරම්භ කිරීම සහ මෙහෙයවීම කළයුතුය.

10. මෙම බලපත්‍රය නිකුත් කොට මාස 12 ක් තුල දී නැවත බලගැන්විය හැකි බලශක්ති ප්‍රභවයේ ප්‍රශස්ථ භාවිතය උදෙසා ස්ථාපිත ධාරිතාව වෙනස් කිරීමේ බලය අධිකාරිය සතුවේ.

11. සංවර්ධනකරු ව්‍යාපෘතියේ ඉදිරිකිරීම් කාලය තුල හෝ ක්‍රියාත්මක කාලය තුල මෙම බලපත්‍රයේ සඳහන් ස්ථාපිත ධාරිතාව වෙනස් කිරීමෙන් වැලකිය යුතුය.

12. නැවත බලගැන්විය හැකි බලශක්ති සම්පත සහ එය නෙලා ගැනීමට අවශ්‍ය ව්‍යුහයන් පාවිච්චි කිරීම. අදාල අනුමත කිරීමේ අධිකාරීන් විසින් අදාළ සම්ප්‍රතිඥත (Stipulated) ප්‍රමිති, නියමයන් සහ චර්යා සංග්‍රහවලට අනුකූල විය යුතුය

13. මේ බලපත්‍රයේ විස්තර කර ඇති අවශ්‍යතා නියමයන් හා කොන්දේසි සපුරාලීම සඳහා සංවර්ධනකරු විසින් වැයකරන ලද යම් මුදලක් වේ නම් එය අධිකාරියේ වගකීමක් නොවේ. එය සම්පූර්ණයෙන්ම සංවර්ධනයකරු විසින් දරාගත යුතුය.

14. ව්‍යාපෘතිය ඉදිකිරීමේ දී සහ එය ක්‍රියාත්මක වන කාලසීමාව තුළ ව්‍යාපෘතිය සඳහා ප්‍රයෝජනයට ගනු ලබන නැවත බලගැන්විය හැකි බල ශක්ති සම්පත් පාරිසරික අනුමැතියේ අඩංගු සියළුම කොන්දේසි වලට යටත්ව යෝග්‍ය සම්ප්‍රජන්‍යයෙන් (Diligence) උපයෝගි කර ගැනීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියා මාර්ග සංවර්ධනකරු විසින් ගත යුතුය.

15. සංවර්ධනකරුගේ නොසැලකිලිමත්කම නිසා හෝ සම්ප්‍රජන්‍යයෙන් (diligence) තොරවීම නිසා හෝ ව්‍යාපෘතියේ ප්‍රයෝජනයට ගනු ලබන නැවත බල ගැන් විය හැකි බල ශක්ති සම්පතට හානියක් සිදුවුවහොත් ඒ සඳහා අධිකාරියට වන්දියක් ගෙවීමට සංවර්ධනකරු බැඳී සිටී. මුදල් කටයුතු භාර ඇමතිවරයා සමග සාකච්ඡා කොට විදුලි බල හා බලශක්ති විෂයට අදාල ඇමතිවරයා විසින් වන්දි මුදලේ ප්‍රමාණය තීරණය කරනවා ඇත.

16. මේ බලපත්‍රය වලංගු කාලය තුළ මෙහි සම්ප්‍රතිඥාත (Stipulated) නියමයන් සහ කොන්දේසි සංවර්ධනකරු විසින් උල්ලංඝනය කළේනම්, පනතේ 21 වන වගන්තියේ (1) වන උපවගන්තියේ (ආ) ඡේදය යටතේ අධිකාරියේ අනුමතය ඇතිව මේ බලපත්‍රය අවලංගු කිරීමට අධිකාරියේ අධ්‍යක්ෂ ජනරාල්ට බලය ඇත.

අධ්‍යක්ෂ ජනරාල්,
ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය.

*පිටපත්* :

(i) අධ්‍යක්‍ෂ ජනරාල්, මහජන උපයෝගීතා කොමිෂන් සභාව

(ii) සාමාන්‍යාධිකාරි, ලංකා විදුලිබල මණ්ඩලය

(iii) අධ්‍යක්‍ෂ ජනරාල්, මධ්‍යම පරිසර අධිකාරිය

(iv) අධ්‍යක්‍ෂ ජනරාල්, නාගරික සංවර්ධන අධිකාරිය

(v) ප්‍රාදේශීය ලේකම්..........................................කොට්ඨාසය

05-626

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.